# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 08/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 02/01/2024 පැය 1935

## මාධ්‍ය නිවේදනය

**මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් මුදවා ගැනීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීමට ත්‍රීරෝද රථයන්හි ස්ටිකර් ප්‍රදර්ශනය කිරීම - ප්‍රජා පොලිස් කොට්ඨාසය.**

2024.01.02 වන අද දින උදෑසන කාලයේදී කොළඹ නියෝජ්‍ය පොලිස්පති කාර්යාල සංකීර්ණය ඉදිරිපිටදී “යුක්තිය” නොනවතින මෙහෙයුම 2024 ට සමගාමීව මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් මුදවා ගැනීම තුලින් නීති ගරුක රටක් බිහිකරලීමේ ක්‍රියාන්විතය උදෙසා ත්‍රීරෝද රථයන්හි ස්ටිකර් ප්‍රදර්ශනය කිරීම මඟින් ප්‍රජාව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහනක් වැඩ බලන පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

පොලිස් මූලස්ථානයේ විශේෂ මෙහෙයුම් මැදිරියේ ස්ථාපිත කර ඇති ඇමතුම ලබා ගන්නාගේ අංකය නොපෙනෙන 071-8598800 දරන දුරකථන අංකය සඳහන් කර ඇති ස්ටිකර් සංකේතාත්මකව ත්‍රීරෝද රථවල ප්‍රදර්ශනය කිරීම වැඩ බලන පොලිස්පතිතුමා විසින් සිදු කිරීමෙන් අනතුරුව කොළඹ උතුර, දකුණ හා මධ්‍යම පොලිස් කොට්ඨාසයන්හි පිහිටි සියළුම පොලිස් ස්ථාන වල ප්‍රජා පොලිස් ස්ථානාධිපතිවරු වෙත මෙම ස්ටිකර් බෙදා දීමද මෙහිදී සිදු කරන ලදි.

මෙම අවස්ථාව සඳහා ප්‍රජා පොලිස් සංචාරක හා ආයෝජන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති මහේෂ් සේනාරත්න, ප්‍රජා පොලිස් හා පාරිසරික ආරක්ෂණ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති රොෂාන් ඩයස්, කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති චන්ද්‍රකුමාර සහ ප්‍රජා පොලිස් කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ඩී.කේ. ප්‍රියන්ත යන මහත්වරුන් ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් රැසක්ද සහභාගී විය.


3.30
6.30


0718 598 800





මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.